[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama සමානර්ථයක් Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 7 ශ්‍රේණිය | විෂයය – සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය I/II | පැය - 02 යි. |
|---|---|---|---|

නම ..............................................................................................................................

**සැලකිය යුතුයි.**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **I කොටසේ ප්‍රශ්නවල මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.**

## I කොටස

- පහත වාක්‍යවල ඉරි ඇඳි කොටසට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. නරක මිතුරන් සමග කිසිම ඇයි හොඳයියක් පැවැත්විය යුතු නැතැ’යි අම්මා අපට කීවා ය.

(i). සුහදතාවක් (ii). සම්බන්ධයක් (iii). තරහක් (iv). විරුද්ධත්වයක්

02. රිය අනතුර දුටු පසු තමා අනූ නවයෙන් බේරුණා යැයි මාමා පැවසුවේ ය.

(i). ඉතා ඉක්මනින් (ii). පහසුවෙන් (iii). යාන්තමින් (iv). නොසැලකිල්ලෙන්

03. සුනිල් සහ නිමල් එකිනෙකාට නයාට අඳු කොළ වගේ ය.

(i). ඉතා ම සමීපයි. (ii). ඉතා ම වෛරයි. (iii). ඉතා ම සුහදශීලීයි. (iv). ඉතා ම මුරණ්ඩුයි.

- මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථ දෙන පදය තෝරන්න.

04. අන්ත - (i). අන්තර (ii). සමාන්තර (iii). අනන්ත (iv). නිරන්තර

05. යහගුණ - (i). අවගුණ (ii). අගුණ (iii). දෙගුණ (iv). තෙගුණ

- මුලින් දී ඇති පදයට සමානාර්ථ දෙන පදය තෝරන්න.

06. මිතුරු - (i). පිළිමල් (ii). පසමිතුරු (iii). නුබ (iv). සකි

07. “පරංගියා කෝට්ටේ ගියා වගේ” ප්‍රස්තාව පිරුළට වඩාත් සමීප අර්ථය වන්නේ,

(i). පරංගියා කෝට්ටේ යාම. (ii). පරංගියා කෝට්ටේ රාජධානිය යටත් කර ගැනීම.

(iii). ළඟ පාරක් තිබියදී දුර පාරකින් යාම. (iv). දුර පාරක් තිබියදී ළඟ පාරකින් යාම.

- පහත ඉරි ඇඳි කොටස වෙනුවට යෙදිය හැකි තනි පදය තෝරන්න.

08. “ජනයා බහුලව වාසය කරන ප්‍රදේශවල පරිසර දූෂණය ශීඝ්‍රයෙන් වැඩි වී ඇත.”

(i). ජනාවාස (ii). ජනාශ්‍රිත (iii). ජනශූන්‍ය (iv). ජනාකීර්ණ

09. “කමල් තම මවට ඉබේ ක්‍රියා කරන රෙදි සෝදනයක් එව්වේ ය.”

(i). ස්වයංවර (ii). ස්වයංක්‍රීය (iii). ස්වාධීන (iv). ස්වාභාවික

10. අනුගමනය යන පදය අයත් වන්නේ,

(i). නාම විශේෂණ පද වලට යි. (ii). ක්‍රියා විශේෂණ පද වලට යි.

(iii). අවසාන ක්‍රියා පද වලට යි. (iv). උපසර්ග පද වලට යි.

11. "පෙරළි පෙරළි සෙල්ලම් කොට"
ඉහත කාව්‍ය පාදයේ ඉරි ඇඳි කොටසේ කාව්‍ය උපක්‍රමය වන්නේ,
(i). එළිසමය යි. (ii). උපමාවකි. (iii). රූපකයයි. (iv). අනුප්‍රාසය යි.

- එක් එක් වාක්‍යයේ ඉරි ඇඳි ක්‍රියාපද වර්ගය අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

12. * ළමයි වතුරට පනිමින් සෙල්ලම් කළහ.
* මල්ලී සඳ දෙස බලා සිනාසුණි.
* තාත්තා කුඹුරට ගියේ ය.
(i). අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා (ii). මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
(iii). පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා (iv). මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා

13. නිවැරදිව පද වෙන් කර ලියා ඇති වාක්‍ය වන්නේ,
(i). ගංගා වලින් පිරි සිදු ජලය ලැබේ. (ii). නිද හස් සමාජ යක් ගොඩ නගමු.
(iii). ආගමික නිදහස අගයමු. (iv). සතුන් ගේ අඩි පාර වල් වන යේ ඇත.

14. * ආචාරී භාග * බඩ සයින් * අනායාවක් * නිග්‍රහ
ඉහත සඳහන් පදවල අරුත් පැහැදිලි කළ විට නිවැරදි පිළිවෙල වන්නේ,
(i). ගුරු පඬුරු, බඩගිනි බැවින්, අවනීතියක්, අවමාන (ii). අවමාන, අවනීතියක්, ගුරු පඬුරු, බඩගිනි බැවින්
(iii). බඩගිනි බැවින්, ගුරු පඬුරු, අවමාන, අවනීතියක් (iv). අවනීතියක්, ගුරු පඬුරු, අවමාන, බඩගිනි බැවින්

15. "ගස වතුසුදු
වී පිරිසිදු
පොහොය නැතිදු
සිල්ගත් බඳු"
ඉහත කාව්‍ය නිර්මාණයේ රචකයා වනුයේ,
(i). ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ (ii). ආනන්ද රාජකරුණා (iii). මුනිදාස කුමාරතුංග (iv). ඇස්. මහින්ද හිමි

- නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

16. ක්‍රීඩා තරගවල දී .......................... මට්ටමෙන් තේරෙන ශිෂ්‍යයෝ කලාප මට්ටමේ තරගවලට ඉදිරිපත් වෙති. (කොට්ඨාශ / කොට්ඨාස)
17. පණ නම් ........................ අග පිණි බිඳු වැන්නේ. (තන / තණ)
18. ලෙනාඩෝ ඩාවින්චි යනු ලොව ................................ චිත්‍ර ශිල්පියෙකි. (පතළ / පතල)

19. "ඇයි මැණියනි, මම කුමන අනායාවක් කළෙම් ද?"
(i). පෙරළි කොමාව, කොමාව, ප්‍රශ්නාර්ථය (ii). කොමාව, පෙරළි කොමාව, ප්‍රශ්නාර්ථය
(iii). ප්‍රශ්නාර්ථය, කොමාව, පෙරළි කොමාව (iv). කොමාව, ප්‍රශ්නාර්ථය, පෙරළි කොමාව

20. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් අතීත කාලයට අයත් වැකිය තෝරන්න.
(i). ධීවරයෝ මසුන් මරති. (ii). සමන් පිච්ච වැලෙහි මල් පිපෙයි.
(iii). අපි මිහිරි හඬින් ගී කියමු. (iv). අම්මා පුතුට කිරි පෙව්වා ය.

(මුළු ලකුණු 2×20=40යි.)

## II කොටස

- පළමුවන සහ දෙවන ප්‍රශ්න අනිවාර්ය වේ. 03, 04, 05, 06, 07 යන ප්‍රශ්නවලින් තවත් ප්‍රශ්න තුනක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. දෙවන වාරයේ දී ඔබ විසින් සිදු කළ ඇගයීම් ප්‍රභේදය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i). ඔබ විසින් සිදු කළ නිර්මාණයට යෙදූ නම කුමක් ද? (ලකුණු 02)

(ii). එම නිර්මාණය කිරීම සඳහා ගුරුවරයාගෙන් ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii). එම නිර්මාණයට කරුණු සෙවීම සඳහා උපයෝගී කර ගත් මාධ්‍ය හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iv). එම නිර්මාණය සකස් කිරීමේ දී ඔබට මතු වූ ගැටළු හතරක් ලියන්න. (ලකුණු 04)

(v). මෙම ක්‍රියාකාරකමෙහි නිරත වීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16යි.)

02. පහත මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.

(i). මුනි සිරිපා පහස ලද සමනොළ කන්ද

(ii). මම ගංවතුරකට මැදිවීමි.

(iii). වන අසිරිය රැක ගනිමු.

(iv). සඳ පහන් රැය

(v). අතීතයේ සිට පැවත එන අපේ ජන කවිය (ලකුණු 14යි.)

03. ඔබ පාසලේ පැවැත්වීමට නියමිත "වාර්ෂික ගුරු උපහාර උළෙල" සඳහා සහභාගී කර ගැනීමේ බලාපොරොත්තු වන්නන් වෙත යැවීමට සුදුසු ආකාරයේ ආරාධනා පත්‍රයක් සකස් කරන්න. පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක/ශිෂ්‍ය නායිකාව ඔබ යැයි සිතන්න.

නැතහොත්

ඔබ පාසලේ 7 ශ්‍රේණියේ ශිෂ්‍යයෝ මෙවර අධ්‍යාපන චාරිකාවේ දී කොළඹ, ජාතික කෞතුකාගාරය නැරඹීමට යාමට අදහස් කරති. ඒ සඳහා අවසර ලබා ගැනීම සඳහා ජාතික කෞතුකාගාරයේ කළමනාකාරතුමා වෙත ලියන ලිපිය සකස් කරන්න. ඔබ, පාසලේ චාරිකා කමිටුවේ ලේකම් යැයි සිතන්න. (ලකුණු 10යි.)

04. පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මගේ රටට දළදා හිමි සෙවණයි
මගේ දැයට දළදා හිමි සරණයි
සැපතින් සපිරුණු නිවහල් දෙරණයි
උපතින් මා හට මේ හැම උරුමයි

දළදා මැදුරේ රන්කොත මුදුනේ
මිණි කිරණින් මුළු රටම අවදිවෙයි
දෙදහස් වසරක මහඟු අතීතය
සීහ තේජසින් යළි පිබිදී එයි

(i). මෙය කුමන වර්ගයට අයත් ගීතයක් ද?

(ii). කවියා රට පිළිබඳව සිදු කරන ප්‍රාර්ථනා දෙකක් ලියන්න.

(iii). ගීත රචකයා පවසන ආකාරයට උපතින් ම අපට උරුම වී ඇත්තේ කුමක් ද?

(iv). මෙම ගීතයේ සඳහන් පරිදි මුළු රටම අවදි වන්නේ කුමකින් ද?

(v). පහත දැක්වෙන වචනවලට සමාන පදය බැගින් ලියන්න.

(අ). දැය .......................................... (ආ). දෙරණ .......................................... (ලකුණු 2×5=10යි.)

05. “ඊට තොප වික්ෂේප නොව: තොපගෙන් කෑ තලවලට මම මිල දෙමි.”

(i). මෙම ප්‍රකාශය කවුරුන් විසින් කියන ලද්දක් ද?

(ii). කා හට කියන ලද්දක් ද?

(iii). මෙම කොටස ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(iv). මෙම පාඩම උපුටා ගත් මුල් කෘතියේ නම ලියන්න.

(v). එය අයත් වන්නේ කවර යුගයට ද? (ලකුණු 2×5=10යි.)

06. ........................................................................

........................................................................

සඳ කැන් මිණි කැට අස්සෙන්

උල්පත්වල කිමිදිලා

(i). මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(ii). මෙම කවිය උපුටාගත් පාඩම කුමක් ද?

(iii). මෙම පද්‍ය නිර්මාණය කළ කවියා කවරෙක් ද?

(iv). මෙම පද්‍ය උපුටාගත් මුල් කෘතිය කුමක් ද?

(v). “මිණි කැට” යන්නෙහි තේරුම ලියන්න. (ලකුණු 2×5=10යි.)

07. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ධාරානිපාත වැසිවලින් අඟහරු පොළොව මත නිර්මාණය වූ ගැඹුරු නිම්න ජාලයක් අදත් එහි දක්නට ලැබේ. යැයි” විශේෂඥයෝ ප්‍රකාශ කරති. පෘථිවියේ ගංගාවලට සමාන ව අඟහරු පොළොව මත ද දිවෙන කඳුරැළි හා විවර රටා එහි නිර්මාණය වී ඇත්තේ, වසර කෝටි ගණනකට ඉහත දී බව එම විශේෂඥයෝ සඳහන් කරති. අඟහරු පෘෂ්ඨය මත ජලය පිළිබඳ සාධක දැක ගන්නට ලැබුණේ, 1971 දී මැරිනර්-9 චන්ද්‍රිකාව අඟහරුට ළං වූ අවස්ථාවේ දී ය. තව ද අඟහරු ලෝකයේ සීත හා උණුසුම් වායු කලාපයක් මෙන් ම එම කලාප දෙක වෙන් කරන පැහැදිලි සීමාවක් ද ඇති බව අනාවරණය විය. තව ද, බීමට පවා සුදුසු ජලය අඟහරු මත ගලා ගොස් ඇති බව 2013 දී ක්‍යුරියෝසිටි චන්ද්‍රිකාවට ග්‍රහණය කර ගත හැකි විය.

(i). අඟහරු මත ගැඹුරු නිම්න සෑදී ඇත්තේ කෙසේ ද?

(ii). එහි ඇති පෘථිවියට සමාන දේවල් දෙකක් ලියන්න.

(iii). ක්‍යුරියෝසිටි චන්ද්‍රිකාව සොයා ගත්තේ කුමක් ද?

(iv). මැරිනර්-9 මගින් සොයාගත් වැදගත් දෙය කුමක් ද?

(v). අඟහරු මත ජීවීන් සිටිය හැකි යැයි ඔබ සිතන්නේ ද? එසේ සිතීමට හේතුව කුමක් ද? (ලකුණු 2×5=10යි.)

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama සමානර්ථයක් Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 7 ශ්‍රේණිය | විෂයය – සිංහල භාෂාව හා සාහිත්‍යය | පිළිතුරු |
|---|---|---|

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | (i) | 06. | (iv) | 11. | (iv) | 16. | කොට්ඨාස |
| 02. | (iii) | 07. | (iii) | 12. | (ii) | 17. | තණ |
| 03. | (ii) | 08. | (iv) | 13. | (iii) | 18. | පතළ |
| 04. | (iii) | 09. | (ii) | 14. | (i) | 19. | (i) |
| 05. | (i) | 10. | (iv) | 15. | (iii) | 20. | (iv) |

(මුළු ලකුණු 2×20=40යි.)

## II කොටස

01. ළමුන් ලියා ඇති සාධාරණ පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (මුළු ලකුණු 16යි.)

02. රචනාව සඳහා

- මාතෘකාව සමග හැඳින්වීම. - ලකුණු 04
- අන්තර්ගතය සහ ප්‍රමාණවත් බව - ලකුණු 06
- ශිල්පීය දක්ෂතා - ලකුණු 04 (ලකුණු 14යි.)

03. නිවැරදි ප්‍රායෝගික ලේඛන සඳහා

- ආකෘතිය - ලකුණු 02
- අන්තර්ගතය - ලකුණු 05
- ශිල්පීය දක්ෂතා - ලකුණු 03 (ලකුණු 10යි.)

04. (i). දේශභාමානී ගී

(ii). මගේ රටට දළඳා හිමි සෙවණයි
මගේ රටට දළඳ හිමි සරණයි

(iii). සැපතින් සපිරුණු නිවහල් දෙරණක්

(iv). දළදා මැඳුරේ ඇති රන් කොත මුදුණේ මිණි කිරණින්

(v). (අ). දැය - දේශය (ආ). දෙරණ - භූමිය (ලකුණු 2×5=10යි.)

05. (i). දිසාපාමොක් ආචාර්යවරයා

(ii). මැලි ස්ත්‍රියට (මහලු ස්ත්‍රියට)

(iii). තිලමුට්ඨි ජාතකය

(iv). පන්සිය පනස් ජාතක පොත

(v). කුරුණෑගල (ලකුණු 2×5=10යි.)

06. (i). ළා අඹ දළු නව නවා
දම් පාටින් ඔළුප දමා

(ii). සිනා කුමාරි

(iii). ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ

(iv). කෝමල රේඛා

(v). මැණික් ගල් (ලකුණු 2×5=10යි.)

07. (i). ධාරානිපාත වර්ෂාවලින්

(ii). ගංගා, වායු කලාපයක්, ජලය

(iii). බීමට පවා සුදුසු ජලය අඟහරු මත ඇති බව

(iv). අඟහරු පෘෂ්ඨය මත ජලය ඇති බව.

(v). ඔව්
එහි ජලය සහ වායු ගෝලයක් ඇති බවට සාධක හමු වී ඇති නිසා (ලකුණු 2×5=10යි.)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න